# ගුණාත්මක පාසල් පද්ධතියක් සඳහා නව පාසල් පාදක කළමනාකරණ වැඩසටහනක යෝග්‍යතාව

ඩබ්.ජී. කුමාරි[1]

සංක්ෂේපය

ලෝකයේ සෑම රටකම පාහේ අධ්‍යාපනයට වැදගත් ස්ථානයක් හිමිවන අතර සංවර්ධනය වෙමින් පවතින තුන් වන ලෝකයේ රටක් වන ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපනයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ශ්‍රී ලංකාවේ බලයට පත් වන සෑම රජයක් විසින්ම අධ්‍යාපනය වෙනුවෙන් විශාල මෙහෙවරක් ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකාවට සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා 1947 දී නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීමෙන් පසු අධ්‍යාපනයේ සිදු වූ විපර්යාසය අතිමහත් ය. එදා පටන් වර්තමානය වන තෙක් අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා නොයෙකුත් වැඩසටහන් පාසල් වලට හඳුන්වා දී ඇත. නමුත් ඒ සියල්ලක්ම අපේක්ෂිත පරිදි සාර්ථක වූයේද යන්න ගැටළු සහිත ය. රජය විසින් 2006 තෝරා ගත් පාසල් කිහිපයක් සඳහා ද පසුව 2010 වන විට සියලුම පාසල් සඳහා අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩි කිරීම සඳහා අළුතෙන්ම වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. එය පාසල් නගා සිටුවීමේ වැඩසටහන නම් වේ. එනම් එමගින් පාසල් සම්බන්ධයෙන් රජය සතු අධිකාරී බලය පාසල් වෙත විමධ්‍යගත කරන ලදි. පාසල සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පාසල් වෙත ලබා දුනි. තීරණ ගැනිමේදී විදුහල්පති දෙමාපියන් හා අවට සමාජය එක්ව පාසල සම්බන්ධයෙන් තීරණ ගන්නා අතර ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ඔවුන් විසින්ම සපුරා ගත යුතු වේ.

**මුඛ්‍ය පද:** *අධ්‍යාපනය, පාසල් පද්ධතිය, කළමනාකරණ ශිල්පීය ක්‍රම*

## හැඳින්වීම

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2014 ඉදිරිපත් කර ඇති පාසල් නගා සිටුවීමේ චක්‍ර ලේඛයට අනුව පාසලේ අභ්‍යන්තර කාර්යය මණ්ඩලයේ හා පාසලට සම්බන්ධ සෙසු කණ්ඩායම් පාසලේ සංවර්ධනය උදෙසා සහභාගිත්ව දායකත්වය ලබා දෙමින් පාසලේ සංවර්ධනයට ලබා දෙනු ලබන සාමුහික එළඹුම් ක්‍රියාවලියක් ලෙස පාසල් නගා සිටුවීමේ වැඩසටහන හඳුන්වා දිය හැකිය.

එනම් එමගින් පාසල් සම්බන්ධයෙන් රජය සතු අධිකාරී බලය පාසල් වෙත විමධ්‍යගත කරන ලදී. පාසල සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පාසල් වෙත ලබා දුනි. තීරණ ගැනිමේදී විදුහල්පති දෙමාපියන් හා අවට සමාජය එක්ව පාසල

---

[1] සමාජ සංඛ්‍යානය (විශේෂවේදී) තෙවන වසර, gayaniw.kumari@gmail.com

සම්බන්ධයෙන් තීරණ ගන්නා අතර ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ඔවුන් විසින්ම සපුරා ගත යුතු වේ.

අධ්‍යාපනයේ වටිනාකම දිනෙන් දින ඉහළ යයි. අධ්‍යපනයේ වැදගත්කම තීව්‍ර කරනු වස් නොයෙක් අධ්‍යාපන වැඩසටහන් පාසල් වලට රජය විසින් හඳුන්වා දෙයි. මේ සෑම උත්සහයකම අරමුණ වනුයේ මානව සම්පත් වර්ධනය කිරීමයි. එසේ මානව සම්පත් වර්ධනය කළ හැකි ප්‍රධානතම අංශය වන්නේ අධ්‍යාපනයයි. ඒ අනුව ගත් විට අපේ රටේද මානව සම්පත් වර්ධනය කළ හැකි ප්‍රධානතම ආයතනය අධ්‍යාපනික අංශයයි. එයට සාමාන්‍ය අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනයද අයත් වේ. එහි විෂයමාලාද අනෙකුත් ඉලක්කද තේමා කරගත යුත්තේ මානව සම්පත් සුරක්ෂණය කිරීම හා ඵලදායීව රටේ සංවර්ධනය සඳහා යොදා ගැනීමයි. ඒ සඳහා ගුරුවරු හා අධ්‍යාපන කළමනාකරුවන්ගේ දැනුමද අවශ්‍යතා පරිදි ගොඩනැගීම චිරන්තන පදනමේ සිට ඉටු කළ නොහැකිය. නව කළමනාකරණ ශිල්පීය ක්‍රම හා ඉගෙනුම් ඉගැන්වීම් ඵලදායී ලෙස ගොඩනැගීමට නව ශිල්පීය ක්‍රමවල අවශ්‍යතාව මතුවේ. එම අවශ්‍යතාවයේ ප්‍රතිඵලයක් වශයෙන් පාසල් නගා සිටුවීමේ වැඩසටහන හඳුන්වා දී ඇත. ලෝකයේ බොහෝ රජයන් විසින් අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීමට නොයෙකුත් ඉලක්ක සහ උපාය මාර්ගයන් හඳුන්වා දෙන ලදී. එනම් රජය විසින් දෙමාපියන් හා අවට සමාජය පාසලට සම්බන්ධ වීමේ ප්‍රවනතාවය වැඩි කිරීමට උපක්‍රමයක් වශයෙන් අධ්‍යාපනය සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය විමධ්‍යගත කරන ලදී (Education Human Development Network, 2007).

දැනට වසර 30ක ට පමණ පෙර සිට පාසල් පාදක කළමනාකරණ වැඩසටහන ඔස්ටේලියාව, කැනඩාව, ඊශ්‍රායලය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වැනි රටවලට හඳුන්වා දී ඇත. අවම පරිවැයක් යටතේ අධ්‍යාපනය සඳහා රජයේ වැය කිරීම් යොදා ගැනීම හේතුවෙන් වඩාත් කාර්යක්ෂම බවක් ඇතිවීම, වගවීම තහවුරුවීම සහ ඉගෙනුම් ඵල ඉහළ නැංවීම පිණිස සේවාලාභීන් බලවත්වීම යන හේතු වැඩසටහන ජනප්‍රිය වීමට බලපා ඇත. සේවාලාභීන් වෙත බලය ලබා දීම මගින් ක්‍රමයෙන් වඩා හොඳ පාසල් කළමනාකරණයකින් එම සේවාලාභීන් ගේ දැනුවත් බව ඉහළ නැංවීම සහ ඔවුන්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාරීවීම මගින් සිසුන් සඳහා වඩා හොඳ සහ ඉගෙනුමට මහෝපකාරී වන ඉගෙනුම් පරිසරයක් නිර්මාණය වී ඇත. (අධ්‍යාපන මානව සංවර්ධන ජාලය, 2007). මෙම වැඩසටහන, ස්වයං පාලිත පාසල් (Self governing schools), ස්වයං කළමනාකරණ පාසල් (Self managing schools), ස්ථාන/ක්ෂේත්‍ර පාදක කළමනාකරණය (Field based management), පාසල් සවිබලකරණය (School empowerment), පාසල් කරා බලය විමධ්‍යගතකරණය (School decentralization), යනුවෙන් විවිධ රටවල භාවිත වන අතර ශ්‍රී ලංකාවේ පාසල් නගා සිටුවීමේ වැඩසටහන (Programme on School Improvement) ලෙස හඳුන්වයි. 2006 වර්ෂය වන විට ශ්‍රි ලංකාවේ තෝරාගත් පාසල් කිහිපයකට පාසල්

නගා සිටුවීමේ වැඩසටහන හඳුන්වා දුන් අතර පසුව 2010 වන විට සියලුම පාසල් වලට මෙම වැඩසටහන හඳුන්වා දී ඇත (Bandur, 2008).

ඒ අනුව පාසල් නගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම මගින් රජය අපේක්ෂා කරනුයේ අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ දැමීමයි. එම ප්‍රධාන අරමුණුට අමතව තවත් සෙසු අරමුණු ද මෙම වැඩසටහන හඳුන්වාදීමේ දී සැලකිල්ලට ගෙන ඇත .

**පාසල් නගාසිටු වීමේ වැඩසටහන හඳුන්වා දීමේ අරමුණු**

පාසල් නගාසිටු වීමේ වැඩසටහන හඳුන්වා දීමේ ප්‍රධානම අරමුණ වන්නේ අධ්‍යාපනයේ ඵලදායිතාවය හා ගුණාත්මකභාවය වර්ධනය කිරීමයි. මීට අමතරව මෙම වැඩසටහන පාසල් වලට හඳුන්වාදීමේ සෙසු අරමුණු කිහිපයක් පවති. තවද පාසල සතුව පවතින හිග සම්පත් උපරිම ඵලදායීතාවයක් ලැබෙන පරිදි උපයෝජනය කළ යුතු බවයි.

පාසලේ මූලික අවශ්‍යතා ප්‍රමුඛතාකරණයට ලක් කර එම අවශ්‍යතා සපුරා ගැනීමට අඩිතාලම සකස් කර ගැනීම කළ යුතුයි. එනම් රජය මගින් මෙහෙයවන පාසල් වන ගුරුවරුන්ට වැටුප් ගෙවීම පමණක් සිදු කරන අතර පාසලේ අනෙකුත් මූලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ශ්‍රමය ඊට අවශ්‍ය අනෙකුත් සාධක සියල්ල පාසල මගින් සපුරා ගත යුතු වේ. අනෙක් අතට පාසලේ දෛනික පවිත්‍රතා කටයුතු නඩත්තු කටයුතු පාසල විසින්ම ඉටු කර ගත යුතු වේ.

පාසලේ සමස්ත කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම සිදු කළ යුතුයි. එනම් පාසලේ පවතින සම්පත් වඩාත් හොඳින් භාවිතා කර යෙදවුම් සම්පත් වලට වඩා වැඩි නිමවුමක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. අනෙක් අතට සම්පත් භාවිතා කිරීමේ දී වැඩිම ප්‍රතිඵල ලබා දෙන විකල්පය තොරා ගැනීමේ හැකියාව පැවතිය යුතුය.

සහභාගිත්ව කළමනාකරණය තුළින් තාර්කික පදනමක් මත තීරණ ගැනීම සඳහා ප්‍රමාණවත් පරිපාලන, කළමනාකරණ හා මූල්‍ය බලතල පාසලට ලබා දීම. එනම් රජය විසින් පාසල් වලට සහභාගිත්ව කළමනාකරණය තුළින් තාර්කික පදනමක් මත තීරණ ගැනීම සඳහා ප්‍රමාණවත් පරිපාලන බලතල ලබා දීම කළමනාකරණ බලතල ලබා දීම හා මූල්‍ය බලතල ලබා දීම සිදු කරනු ලබයි. පාසල් වලට තීරණ ගැනීමේ දී අවශ්‍ය බලතල පැවරීම මගින් රජය එම පාසල් වල අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ දැමීම අපේක්ෂා කරයි. මෙහිදි රජය මගින් අධීක්ෂණ කටයුතු පමණක් සිදු කරනු ලබයි.

පාසල් කළමනාකරණයේ පාරදෘශ්‍යතාවය හා නම්‍යශීලීතාවය තහවුරු කිරීම තුළින් පාසලේ වගකීම හා වගවීම සහතික කිරීම මෙම වැඩසටහනේ තවත් අරමුණක් වශයෙන් සඳහන් කළ හැකිය. මෙහිදි නම්‍යශිලීත්වය තහවුරු කිරීම මගින් පාසලට

ස්වාධීනව තීරණ ගැනීමේ අවස්ථාව හිමි වන අතර එමගින් පාසලේ වලකීම හා වගවීම සහතික වීම සිදු වෙනවා. ඒ වගේම මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමෙන් පාසල් වලට ලැබෙන සහය නැත්නම් ප්‍රතිලාභ ඉමහත්ය (අධ්‍යාපන අමාත්‍යාංශය, 2014).

**පාසල් නගා සිටුවීමේ වැඩසටහන මගින් පාසල් තුළට ලැබෙන ප්‍රතිලාභ**

පාසල් නගාසිටු වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම මගින් සිදු වන මූලික ප්‍රතිලාභය වනුයේ පාසල් අධ්‍යපනයේ ගුණාත්මක බව හා ඵලදායීතාවය ඉහළ දැමීමයි. මීට අමතරව පාසල් පාදක ගුණාත්මක ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රතිසම්පාදනය පිළිබඳ චක්‍රලේකය සහ මාර්ගෝපදේශ අත්පොතෙහි සඳහන් වන පරිදි පාසල් නගා සිටුවීමේ වැඩසටහන පාසල් වලට හඳුන්වා දීමේ අපේක්ෂිත සෙසු ප්‍රතිඵල කිහියකි. එනම් පාසල් සිසුන්ගේ විභව්‍යතා හඳුනාගැනීම තුළින් ජාතික විෂයමාලා ප්‍රතිපත්තිය තුළ අර්ථකථනය කර ඇති නිපුනතා අත්පත් කර ගැනීම සඳහා උචිත ඉගෙනුම් පරිසරයක් ගොඩ නැගීම, තීරණ ගැනීමේ බලතල පාසල සතුව පවතින හෙයින් පාසලේ ජාතික විෂයමාලා ප්‍රතිපත්ති තුළ අර්ථකථනය කර ඇති නිපුණතා අත්පත් කර ගැනීමට හැකි වන පරිදි උචිත ඉගෙනුම් පරිසරයක් ගොඩ නැගීම කළ යුතුය. එමගින් අධ්‍යාපනයේ ඵලදායීතාවය හා ගුණාත්මකභාවය ඉහළ නැංවිය හැකිය.

පාසලේ සමස්ත ප්‍රගතිය පාසල් ප්‍රජාවට සන්නිවේදනය කිරීමේ ක්‍රමෝපායයන් සහ ඊට ලැබෙන ප්‍රතිචාර මත වඩාත් ඉහළ මට්ටමේ ඉලක්ක කරා යොමු වූ නිර්මාණශීලි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ යුතුය. ප්‍රජාවගේ අවශ්‍යතාවලට වඩාත් සංවේදී වූ පාසලක් බිහි විය යුතුයි. නිතරම පාසල හා ප්‍රජාව අතර වඩාත් හොඳ අන්‍යෝන්‍ය රැඳියාවක් පැවතිය යුතුය. දැනුම් පදනම මත වෘත්තිය නිපුනතාවන් නිරන්තරයෙන් යාවත්කාලීන වන ගුණාත්මක බවින් යුත් ක්‍රියාකාරී කාර්ය මණ්ඩලයක් පාසල විසින් පවත්වාගෙන යා යුතුය. පාසල් සිසුන්ගේ අධ්‍යාපනික ගැටළු හඳුනාගෙන වැඩ ලෝකයට ගැලපෙන පරිදි අධ්‍යාපනික හා වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශන ලබාදීමේ වැඩපිළිවෙලක් ඇතුළු අධ්‍යාපනික ප්‍රතිඵල අත් කර ගැනීමට සහාය වීම කළ හැකිය (අධ්‍යාපන අමාත්‍යාංශය, 2014).

ඒ වගේම පාසල් නගාසිටුවීමේ වැඩසටහන මගින් පාසලේ සාමුහික ක්‍රියාකාරකම් මෙන්ම සහභාගිත්ව තීරණ ගැනීමේ සංස්කෘතිය ද වර්ධනය වී ඇති අතර විදුහලප්ති සහ කාර්ය මණ්ඩලය අතර සන්නිවේදනය සහ අන්‍යොන්‍ය අවබෝධය ද වැඩි වී ඇත. නමුත් ඉහත ප්‍රතිඵලයන් ළගා කර ගැනීමට පාසල් නගා සිටුවීමේ වැඩසටහන මගින් හැකි වූවත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී එයට සම්බන්ධ සියලු පාර්ශවයන් නොයෙකුත් ගැටළු වලට මුහුණ දීමට සිදු විය

## පාසල් පාදක කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දී ඇති ගැටළු

පාසලේ දැක්ම සහ අරමුණු තීරණය කිරීමේදී 2006 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලය තුළ වැඩි දියුණුවක් දක්නට ලැබෙන අතර තොරතුරු රැස් කිරීම, විවිධ මුලාශ්‍ර මගින් පාසල් සංවර්ධනයට අරමුදල් ලබා ගැනීම, ගුරුවරුන්ට වගකීම් පැවරීම ආදී කරුණුවලින් ද විදුහල්පති භූමිකාව එම කාලය තුළ වැඩි දියුණුවක් සිදු වී ඇත. 2010 වර්ෂය තුළ සියම පාසල් වලට පාසල් පාදක කළමනාකරණය හඳුන්වා දීමෙන් පසු පෙර වසර තුනෙහි මෙන් සාර්ථක ප්‍රතිඵල ළගා කරගෙන නොමැත. එම නිසා වර්තමානය වන විට ඒ පිළිබඳ ව නැවතත් පාසල් දැනුවත් කිරීම් සිදු කර ඇති අතර පාසල් සැලසුම්කරණය, විෂයමාලා කළමනාකරණය, අධ්‍යාපන කළමනාකරණ කුසලතා, මානව සහ භෞතික සම්පත් කළමනාකරණය, වැඩසටහනේ අරමුණු සහ ඵලයන් පිළිබඳ පුහුණු වීම් ලබා දී ඇත. වැඩසටහන පාසල් තුළ ක්‍රියාත්මක කිරීමේ දී ඒ හා සම්බන්ධ නිළධාරීන් නොයෙකුත් ගැටළු වලට මුහුණ දී ඇත. එනම් පාසල් නගා සිටුවීමේ වැඩසටහන වරදවා තේරුම් ගැනීම හා පාසලේ සියලු පාර්ශවකරුවන්ට වැඩසටහනේ සංකල්පය පිළිබඳ පූර්ණ අවබෝධයක් නොලැබීම මෙහි ඇති ප්‍රධාන ගැටළුවකි. පාසල් නගා සිටුවීමේ වැඩසටහන පාසල් වලට හඳුන්වා දුන්නද එහි මූලික අරමුණ පිළිබඳ නිසි අවබෝධයක් ආදාළ පාර්ශවකරුවනට නොමැත. සමස්ත වැඩපිළිවෙල පිළිබඳව පූර්ණ අවබෝධයක් ඔවුන් සතුව නොපවති ලඳ අවබෝධයෙන් වැඩසටහන ක්‍රියාත්මක ක්‍රීරීමේ දී නොයෙක් ගැටළු වලට මුහුණ දීමට සිදු වේ (සුමිත්, 2012).

ශිෂ්‍යයාගේ පූර්ණ සංවර්ධනය සඳහා සැලැස්මක් පාසල සතුව නොමැති වීම දක්නට ලැබෙන තවත් ගැටළුවකි. එමගින් සිසුන්ගේ පූර්ණ සංවර්ධනයක් අපේක්ෂා කළ නොහැකිය. එවිට අධ්‍යාපනයේ ගුණාත්මකබව වැඩි කරගැනීමට නොහැකි වනු ඇත (කුලරත්න, 2008).

පාසල් වල විදුහල්පතිවරුන් ඒකාධිපත් අන්දමින් ක්‍රියා කිරීම මගින් අනෙක් පාර්ශවකරුවන්ගේ සහය මෙම වැඩසටහනට ලබා ගැනීමට නොහැකි වීම, මුල්‍යය කළමනාකරණය පිළිබඳ ගැටළු මතු වීම, සැලසුම්කරණ ක්‍රියාවලියේ දී පාසලේ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය අවම මට්ටමක පැවතීම ආදීය දක්නට ලැබේ.
එම ගැටළු මගහරවා ගැනීමට හැකි වනුනේනම් පාසල් නගාසිටු වීමේ වැඩසටහනෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළගාකර ගැනීමට හැකියාව පවති. ඒ සඳහා රජයට මෙන්ම විදුහල්පතිතුමන්ටද නොයෙකුත් විසඳුම් ක්‍රියාවට නැංවිය හැකිය.

## පාසල් නගාසිටු වීමේ වැඩසටහන සංවර්ධනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

පාසල් නගාසිටුවීමේ වැඩසටහන ව්‍යාප්ත කිරීම පිණිස දැනට පාසල් නගාසිටුවීමේ වැඩසටහන යටතේ ආයතනික ව්‍යුහයන් පිහිටුවා ඇතත් එහි ක්‍රියාකාරකම් අඩු මට්ටමකින් සිදු වන පාසල්වල වැඩසටහනේ ක්‍රියාකාරිත්වය වඩාත් ශක්තිමත් කිරීම

අවශ්‍ය වේ. මේ සඳහා එම පාසල්වල භූමිකා සුවිශේෂණය, ධාරිතා සංවර්ධනය, අඛණ්ඩ පුද්ගල සහ මූල්‍යමය සහාය ලබා දීම යන කරුණු සම්බන්ධ ව අවධානය යොමු කළ යුතු ය. ඒ අනුව මෙම වැඩසටහන සංවර්ධනය කිරීම සඳහා රජයට මෙන්ම පාසල්වල විදුහල්පතිවරුන්ට නොයෙකුත් ක්‍රියාමාර්ග ගත හැකිය

**රජයට ගත හැකි ක්‍රියාමාර්ග**

මේ සඳහා පාසල් පැමිණීම වැනි කරුණු සම්බන්ධ ව ගුරුවරුන් ප්‍රදේශයේ පාසල් ප්‍රජාවන්ට වඩාත් වග වන පරිදි ප්‍රතිසංස්කරණයක් සිදු කළ යුතුය. දැනට මධ්‍යගත ලෙස ගුරු භවතුන් බඳවා ගැනීමේ ක්‍රම වේදය වෙනුවට ක්‍රමයෙන් පාසල් මට්ටම දක්වා බලය බෙදා වෙන් කළ යුතු ය. නිෂ්ඨාවක් ලෙස බලය විමධ්‍යගත කිරීමක් නොව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම පිණිස පාසල් මට්ටමේ තීරණ ගනු ලබන්නන්ට ව්‍යවහාර කළ හැකි ක්‍රමවේදයක් ලෙස යොදාගත යුතුය. සියලු ම වර්ග සහ ප්‍රමාණවල පාසල්වලට උචිත වන පරිදි පාසල් සංවර්ධන කමිටු සහ පාසල් කළමනාකරණ කණ්ඩායම් පිහිටුවිය හැකි වන පරිදි ඒ සම්බන්ධ රෙගුලාසි නැවත සමාලෝචනය කළ යුතු ය.

**විදුහල්පතිවරුන්ට ගත හැකි ක්‍රියාමාර්ග**

රැස්වීම් සඳහා දෙමාපියන්ගේ පැමිණීම, පාසල් කමිටු සඳහා සම්බන්ධ වීමට, ස්වේච්ඡා කටයුතුවලට සම්බන්ධ වීමට හෝ භෞතික තත්වයන්, සම්පත්, සේවාවන්, නඩත්තු ඉහළ නැංවීමට අවශ්‍ය මූල්‍ය හෝ වෙනත් දායකත්වයන් ලබා දීම දිරිමත් කළ යුතු ය. එම වැඩසටහන තුළින් දරුවන්ගේ ඉගෙනුම් හැකියාවන් වර්ධනය සඳහා නිවෙස් පරිසරයේ විශාල බලපෑමක් පවතින බවත් දෙමාපියන්ට එය වෙනස් කිරීමේ විශාල බලයක් පවතින බවත් දෙමාපියන් තුළ පවතින අවබෝධය වර්ධනය කිරීමෙන් දරුවන්ට යහපත් ඉගෙනුම් අත්දැකීම් සැපයීම සඳහා නිවෙස් පරිසරය සකස් කිරීම පිණිස දෙමාපියන් තුළ විශ්වාසය සහ සඵලතා හැඟීමක් වර්ධනය කිරීම, දරුවන්ගේ ගෙදර වැඩවල දී අන්තර් ක්‍රියාකාරී විය යුතු අන්දම දරුවන්ගේ වයස හා හැකියා මට්ටම අනුව රඳා පවතින අන්දම යන ඉගෙනීමේ දී දෙමාපියන් විසින් අනුගමනය කළ යුතු සුවිශේෂී චර්යා පැහැදිළි කර දීම යන කරුණු මෙම වැඩසටහන්වල දී අවධානයට ලක් කළ යුතු ය.

මෙම වැඩසටහන්වලට සහභාගිවන දෙමාපියන් සහ අනෙකුත් ප්‍රජාවන් සමග සහභාගි නොවන දෙමාපියන් සම්බන්ධ කළ හැකි ආකාර ගැන අවධානය යොමු කළ යුතුය. පුද්ගල ජීවිතයේ ඵලදායී ක්‍රියාකාරිත්වයට අත්‍යාවශ්‍ය වන ජීවිත නිපුණතා, මෘදු කුසලතා හෝ සාමාන්‍ය කුසලතා, අන්තර් පුද්ගල සබඳතා සහ රැකියා නියුක්තිය හෝ ආර්ථික ක්‍රියාකාරකම් සංවර්ධනය සඳහා ප්‍රජා සහභාගිත්වය පුළුල් කළ යුතුය. (අධ්‍යාපන අමාත්‍යාංශය, 2010).

අරමුණු පිහිටුවා ගැනීම, ශිෂ්‍ය සාධනය ඇගයීම, සාර්ථකත්වය සහතික කිරීම පිණිස අත්‍යාවශ්‍ය ඉගෙනුම් අත්දැකීම් තීරණය, ඉගෙනුම් ඵල මිනුම සහ දෙමව්පියන්ට වාර්තා කිරීම පිණිස පාසල්වලට සහාය අවශ්‍ය වේ. මෙම ක්‍රියාකාරකම් යටතේ

ගුරුවරුන්ගේ භාවිතය සඳහා ප්‍රමාණික දත්ත පාදක සංවර්ධනය සහ පවත්වා ගැනීම සඳහා පාසල්වලට සහායවීමට අපේක්ෂා කෙරේ. පාසල් තම ක්‍රියාකාරකම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර එමගින් දෙමාපියන්ට සහ ප්‍රජාවට වගවිය යුතු ය. මෙයට සම්මත පරීක්ෂණ මගින් ශිෂ්‍ය සාධනය මැනීමෙන් ලබා ගන්නා දත්ත ද ඇතුළත් විය යුතු ය.

**සමාලෝචනය**

මෙතෙක් විමර්ශනය කළ කරුණු වලට අනුව පැහැදිලි වන්නේ අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නංවනු පිණිස 2006 වර්ෂයේ දී තෝරා ගත් පාසල් කිහිපයකට ද 2010 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ සියලුම පාසල් වලට ද රජය විසින් පාසල් නගා සිටුවීමේ වැඩසටහන හඳුන්වා දුනි. නමුත් ලෝකයේ බොහෝ රටවල මෙම වැඩසටහන සම්බන්ධයෙන් කළ ඇති පර්යේෂණ ග්‍රන්ත ඇසුරෙන් පැහැලි වන්නේ පාසල් තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අදාළ පාර්ශවකරුවන් නොයෙකුත් ගැටළු වලට මුහුණ දී ඇති බවයි. ඇතැම් පාසල් මෙම වැඩසටහන මගින් තම පාසල් වල අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නංවාගෙන ඇති බව ද පර්යේෂණ වලින් තහවුරු කර ගෙන ඇත . සමස්තයක් වශයෙන් පෙනී යන්නේ පාසල් නගා සිටුවීමේ වැඩසටහන, මගින් නව පාසල් පාදක කළමනාකරණ ස්ථාපනය කිරීමට, අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ දැමීමට රජය විසින් හඳුන්වාදුන් වඩාත් යෝග්‍යය වැඩසටහක් වශයෙන් හඳුනාගත හැකි බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Bandur, A. (2008). A study of the implementation of school based management in flores primary school in Indonesia. Austrailia.

Education Human Development Network (2007) *Guiding principles for implementing school-based management programs*. Retrieved from http:// www.worldbank.org/ education/ economicsed

Nenyod, B. (2002). *School-based management: Thai ways and methods: Executive summary of the report on national pilot study: Learning reform schools for developing quality of learners.* Office of the National Education Commission (ONEC), Office of the Prime minister, Thailand.

අධ්‍යාපන අමාත්‍යාංශය. (2014). පාසල් නගා සිටුවීමේ වැඩසටහන 2014/28 චක්‍රලේඛය

කුලරත්න, ඩබ්. ජී. (2008). පාසල් නගා සිටුවීමේ පාර්ශවකරුවන්ගේ අත්පොත: පාසල් හි සුසාධ්‍යකරණ වැඩසටහන සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතයට පහසු ස්වයං අධ්‍යයන මොඩියුලය, ද්විතීයික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය II, බත්තරමුල්ල: අධ්‍යාපන අමාත්‍යාංශය

සුමිත්, පී. (2012). පාසල් නගා සිටුවීමේ වැඩසටහනේ කාර්යසාධනය සහ ඒ පිළිබඳ ව විදුහල්පතිවරුන් හා අධ්‍යාපන නිළධාරීන් මුහුණ දී ඇති ගැටළු, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තුමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකාව